චක්‍රලේඛ අංක - 01/2013

මගේ අංකය-බ.ප.ස.සේ.කො./6/ චක්‍රලේඛ
සමුපකාර සේවක කොමිෂන් සභාව,
121/3, කිරුළපන මාවත,
කොළඹ 05.
2013.01. 18

බස්නාහිර පළාතේ සියලුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්,
ස.ණ.ස.සමිතිවල
සභාපතිවරුන් වෙත.

# සමුපකාර සේවකයින් සඳහා 2013 වර්ෂයේ නිවාඩු.

සමුපකාර සේවක කොමිෂන් සභා රෙගුලාසි මාලාව අනුව සමුපකාර සේවකයින්ට හිමිකම් ඇති ප්‍රසිද්ධ නිවාඩු වූ කලී සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ ගරු කම්කරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පමුණුවන ලද දිනයන් ම වේ. මේ අනුව පහත සඳහන් දිනයන් සමුපකාර සේවකයින් සඳහා නිවාඩු දින වශයෙන් කොමිෂන් සභා නියමය පිරිදි දන්වමි.

| | | |
|---|---|---|
| 1) ජනවාරි | - 14 | දෙමළ තෛපොන්ගල් දිනය |
| 2) ජනවාරි | - 25 | (මිලා-දුන්-නබි) නබි නායකතුමාගේ ජන්ම දිනය |
| 3) පෙබරවාරි | - 04 | ජාතික දිනය |
| 4) අප්‍රේල් | - 13 | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනයට පෙර දිනය |
| 5) අප්‍රේල් | - 14 | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනය |
| 6) මැයි | - 01 | මැයි දිනය |
| 7) මැයි | - 25 | වෙසක් පුර පසොලොස්වක දිනට පසු දිනය |
| 8) දෙසැම්බර් | - 25 | නත්තල් උත්සව දිනය |

02. ඉහත සඳහන් දිනයන්ට අමතරව සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් සමුපකාරිකයින්ගේ දිනය වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන දිනයද නිවාඩු වශයෙන් දිය යුතු ය. තව ද මීට අමතරව රජය විසින් අවස්ථාවෝචිත පරිදි " රජයේ නිවාඩු " දිනයන් ලෙස ප්‍රකාශයට පත්කරනු ලබන දිනයන් සඳහා හාම්පුතුන්ගෙන් ද සියා සේවකයින් සඳහා නිවාඩු දෙන ලෙස ඉල්ලීමක් කළහොත් එවැනි අවස්ථාවල සමුපකාර සමිතිවලට ද, අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි තම සේවකයින් ට නිවාඩු දීම ගැන තීරණය කළ හැකිය. 2013 වර්ෂය සඳහා සිංහල/දෙමළ අවුරුද්දට පෙර දිනයන් නිවාඩු වශයෙන් යොදා ඇති බැවින් පාරිභෝගිකයින්ගේ පහසුව තකා යම් සමිතියක් කැමැත්තේ නම් සමිති කාර්යාලය හෝ ප්‍රාදේශිකයන් මේ දිනවල එක් දිනයක් හෝ දින දෙකම හෝ විවෘතව තැබීමටත්, එම දිනවල වැඩ කිරීම සඳහා සේවකයින් උපදෙස් දීමටත් කොමිෂන් සභාවේ

අනුමැතිය ලැබේ. එසේ ක්‍රියාකරනු ලැබූ අවස්ථාවලදී ඒ වෙනුවෙන් සමාන දින ගණනක් සම්පූර්ණයෙන් ම වැටුප් සහිතව ඊළඟට එන දින 30 ඇතුලත දී සේවකයින්ට නිවාඩු ලබාදිය යුතු ය. මෙසේ සමිති කාර්යාලයක්, සමිති ප්‍රාදේශිකයක් විවෘතව තබන අවස්ථාවේදී සේවයේ යෙදවීමට උපදෙස් දෙනු ලැබූවේ මුළු සේවක සංඛ්‍යාවම වුවත්, ඉන් කොටසක් වුවත් නොපමාව ඒ බැව් කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතුය .

03. ඉහත දැක්වූ නිවාඩු දිනවලින් කිසිවක් සමිතියේ සතිපතා දෙන නිවාඩු 1 1/2ට ඇතුලත් වුවහොත් ඒ වෙනුවෙන් පිළිවෙලින් අඩ දිනක් හෝ සම්පූර්ණ දිනක් නිවාඩු වශයෙන් ඊළඟට එන දින සේවකයින්ට නිවාඩු වශයෙන් දිය යුතු ය. මීට විකල්පයක් වශයෙන් දෙපක්ෂයේ එකගතාව ඇතුව ඒ වෙනුවට දින භාගයක් හෝ එක් දිනක වැටුප හෝ අවස්ථාවෝචිත පරිදි ගෙවිය යුතුය .

කොමිෂන් සභාවේ නියමය පරිදිය.

අයි.ආර්.සෝමසිරි.
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් -

1. බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්
2. ලේකම්, බස්නාහිර පළාත් ප්‍රවාහන හා ක්‍රීඩා හා තරුණ කටයුතු සංස්කෘතික හා කලා කටයුතු ආහාර සැපයීම් හා බෙදා හැරීම් සමුපකාර සංවර්ධන හා ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ සමුපකාර අමාත්‍යාංශය
3. බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
4. ලේකම්, මධ්‍යම රජයේ සමුපකාර සේවක කොමිෂන් සභාව
5. සියලුම පළාත් සමුපකාර කොමිෂන් සභා ලේකම්වරුන්
6. සියලුම වෘත්තීය සමිති සංගම්